# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1864/32 - 2014 මැයි මස 27 වැනි අඟහරුවාදා - 2014.05.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී.1/2011.

**2006 අංක 27 දරන දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය පනත**

2006 අංක 27 දරන දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය පනතේ 34 වැනි වගන්තිය සමග කියවිය යුතු 30 වැනි වගන්තිය යටතේ සෞඛ්‍ය අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

මෛත්‍රීපාල සිරිසේන,
සෞඛ්‍ය අමාත්‍ය.

2014 මැයි මස 27 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

2012 අගෝස්තු මස 08 වැනි දින අංක 1770/15 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද දුම්කොළ නිෂ්පාදන (ලේබල් කිරීමේ සහ ඇසුරුම් කිරීමේ) නියෝග මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

1. එම නියෝගවල 5 වන නියෝගයේ "සෑම සිගරට් පැකට්ටුවක, පාර්සලයක, සිගරට් අඩංගු සැහැල්ලු කාඩ්බෝඩ් පෙට්ටියක දෙපැත්තෙහිම මුද්‍රණය කළ යුතු අතර එය පැකට්ටුවේ, පාර්සලයේ, සැහැල්ලු කාඩ්බෝඩ් පෙට්ටියේ ඉඩ ප්‍රමාණයෙන් සියයට අසූවකට (80%) වඩා අඩු නොවන ලෙස දෙපැත්තෙහිම මුද්‍රණය විය යුතුය." යන වචන වෙනුවට "සෑම සිගරට් පැකට්ටුවක, පාර්සලයක, සැහැල්ලු කාඩ්බෝඩ් පෙට්ටියක ඉදිරිපස හා පිටුපස යන දෙපැත්තෙහිම මුද්‍රණය කළ යුතු අතර එය පැකට්ටුවේ, පාර්සලයේ සැහැල්ලු කාඩ්බෝඩ් පෙට්ටියේ ඉදිරිපස හා පිටුපස යන දෙපැත්තෙහි ඉහළ මතුපිට ප්‍රදේශයේ සියයට හැටකට (60%) වඩා අඩු නොවන ලෙස දෙපැත්තෙහිම මුද්‍රණය විය යුතුය." යන වචන මෙයින් ආදේශ කරනු ලැබේ.

2. එම නියෝගවල 6 වන නියෝගයේ සෑම "පැකට්ටුවක්, පාර්සලයක්, සැහැල්ලු කාඩ්බෝඩ් පෙට්ටියක් හෝ ලේබලයක් තුළ එම දුම්කොළ නිෂ්පාදනයෙහි අඩංගු නිකොටින්, තාර, ෆෝමැල්ඩිහයිඩ් හා අනෙකුත් විෂ ද්‍රව්‍ය ඇතුළුව එහි සංඝටක සහ විමෝචක පිළිබඳ අදාළ විස්තර" යන වචන වෙනුවට "සෑම පැකට්ටුවක්, පාර්සලයක්, සැහැල්ලු කාඩ්බෝඩ් පෙට්ටියක් හෝ ලේබලයක් තුළ එම දුම්කොළ නිෂ්පාදනයෙහි නිකොටින් සහ තාර ප්‍රමාණය" යන වචන මෙයින් ආදේශ කරනු ලැබේ.

3. එම නියෝගවල 7 වන නියෝගය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන නියෝගය මෙයින් ආදේශ කරනු ලැබේ :-

"සෑම දුම්කොළ නිෂ්පාදනයක් අඩංගු පැකට්ටුවක්, පාර්සලයක්, සැහැල්ලු කාඩ්බෝඩ් පෙට්ටියක් හෝ ලේබලයක් මත අදාළ නිෂ්පාදිත දිනය, මාසය සහ වර්ෂය සඳහන් විය යුතු ය." ;


1A - G 19620 — 560 (2014/05)



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

4. එම නියෝගවල 10 වන නියෝගයට පසුව පහත දැක්වෙන නියෝගය ඇතුළත් කිරීමෙන් :-

"11. සෑම දුම්කොළ නිෂ්පාදන ආනයනකරුවකු විසින් මෙම නියෝගවල නිශ්චිතව දක්වා ඇති අවශ්‍යතාවලට අනුකූලව ස්ටිකර් ඇලවීම මඟින් මෙම නියෝගවලට අනුකූලව කටයුතු කළ යුතුය.

5. 2013 පෙබරවාරි 15 දින හා අංක 1797/22 *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද සහ 2012 නොවැම්බර් මස 08 වැනි දින හා අංක 1783/16 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද දුම්කොළ නිෂ්පාදන (ලේබල් කිරීමේ සහ ඇසුරුම් කිරීමේ) නියෝග මෙයින් පරිච්ජින්න කරනු ලැබේ.

6. මෙම නියෝග 2014 ජූලි මස 01 දින සිට බලපවත්වනු ලැබිය යුතු ය.

06 - 270

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.